මගේ අංකය : සී.ප්‍රා.ස /1/5/2018,
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.
2018.06.04.

සීතාවක ප්‍රාදේශීය සභාවේ,

ගරු සභාපති/උප සභාපති/ මන්ත්‍රී,

.........................................................................................
මැතිතුමනි / මැතිතුමියනි,

**2018 ජූනි මස මහා සභා රැස්වීම – 03 වන මහා සභාව.**

සීතාවක ප්‍රාදේශීය සභාවේ 2018 ජූනි මාසයට නියමිත 03 වන මහා සභා රැස්වීම 2018.06.11 වන සඳුදා දින, පෙ.ව. 10.00 ට සීතාවක ප්‍රාදේශීය සභාවේ සභා ශාලාවේ දී පැවැත්වේ.

එදිනට ඔබතුමාගේ / ඔබතුමියගේ පැමිණීම ගෞරවයෙන් බලාපොරොත්තු වෙමි.

මෙයට,
ගරු සභාපතිතුමාගේ නියමය පරිදි,

කේ.ඒ. චන්දන පද්මසිරි,
ලේකම්,
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.

**න්‍යාය පත්‍රය.**

01. පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කර ගැනීම.

02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරිම.

04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.

05. යථා පරිදි කල් දී ඇති යෝජනා.

**05 – (01)** ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 184 (2) වැනි උප වගන්තියේ විධි විධාන යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1887/16 හා 2014 නොවැම්බර් මස 04 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනය පරිදි සීතාවක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙකුට, උප සභාපතිවරයෙකුට හෝ සභිකවරුන්ට සභාවේ කාර්යයන් සඳහා ගමන් කිරීමේදී දරනු ලබන වියදම් ප්‍රතිපූර්ණය කිරීමක් වශයෙන් රුපියල් දෙදහස් පන්සියයක ස්ථිර ගමන් වියදම් දීමනාවක් 2018 ජුනි මස සිට මාසිකව ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**05 – (02)** ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විශාල වශයෙන් දෛනිකව එකතු වන දිරන කසල කොම්පෝස්ට් පොහොර බවට පත් කිරිමේ අරමුණින් කොස්ගම ප්‍රදේශයේ පිහිටුවා ඇති කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාල සීමාව 2018.06.30 දින අවසන් වීමට නියමිත බැවින්, සාර්ථකව ක්‍රියාත්මක වන එම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාල සීමාව 2018.012.31 දින දක්වා මාස 06 කින් දිර්ඝ කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**05 – (03)** ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විශාල වශයෙන් එකතු වන නොදිරන කසල වර්ග කර ප්‍රතිචක්‍රියකරණය කල හැකි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කරන මධ්‍යස්ථාන වලට යැවීමට කසල වර්ග කර බේල් කිරිම සඳහා හංවැල්ල ප්‍රදේශයේ පිහිටුවා ඇති පොලිතින් කැට බේල් කිරිමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාල සීමාව 2018.07.31 දිනෙන් අවසන් වීමට නියමිත බැවින් සාර්ථකව ක්‍රියාත්මක වන එම ව්‍යාපෘතියේ ව්‍යපෘති කාල සීමාව 2019.01.31 දින දක්වා මාස 06 කින් දිර්ඝ කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**05 – (04)** ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කළ යුතු පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ව්‍යාපෘති ඊට අනුරූපව ඇති සමිති මගින් හෝ කොන්ත්‍රාත් ආයතනය සමග ගිවිස ගනිමින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අඅ. | ව්‍යාපෘතිය | මූල්‍ය සම්පාදනය | කොන්ත්‍රාත් සමිතිය | මුදල රු. |
|---|---|---|---|---|
| 01 | කහහේන කඩුගොඩ මාර්ගයේ කරදවලට හැරෙන ස්ථානයේ තාර දමා සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති, කහහේන සමගි ගොවි සංවිධානය, කහහේන. | 246,693.04 |
| 02 | සීතාවක ප්‍රාදේශිය සභාවට අයත් කහහේන මාඹුල පොදු මාර්ගය සංවර්ධනය කිරිම. | පළාත් නිශ්චිත | සභාපති, කහහේන සමගි ගොවි සංවිධානය, කහහේන. | 1,149,838.16 |
| 03 | සීතාවක ප්‍රාදේශිය සභාවට අයත් හංවැල්ල පෙර පාසලේ උඩු මහලේ ප්‍රජා ශාලාව ඉදි කිරිම. | පළාත් සංවර්ධන | සභාපති, හංවැල්ල නගරය ග්‍රාම සංවර්ධන සමිතිය, හංවැල්ල. | 1,999,511.38 |
| 04 | මාවතගම බටහිර රිටිගහහේන ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරිම. | සුබිත පුරවර | සභාපති, පැරකුම් ගොවි සංවිධානය, මාවතගම. | 1,175,108.07 |
| 05 | ඉහළ හංවැල්ල දකුණ ගොපල්ලමුල්ල පාර තාර දමා සංවර්ධනය කිරිම. | සුබිත පුරවර | සභාපති, සමගි වැඩිහිටි සංවිධානය, ඉහළ හංවැල්ල. | 585,856.25 |
| 06 | පහත්ගම රෝමානු කතෝලික විද්‍යාලයට පිවිසෙන ප්‍රධාන මාර්ගය තාර දමා සංවර්ධනය කිරිම. | සුබිත පුරවර | සභාපති, හංවැල්ල නගරය ග්‍රාම සංවර්ධන සමිතිය, හංවැල්ල. | 585,459.07 |
| 07 | හංවැල්ල රාජසිංහ පාසල් පාරේ අල්විස් මහතාගේ නිවස අසල සිට (අතුරු මාර්ගය) ඉදිරියට තාර දමා සංවර්ධනය කිරිම. | සුබිත පුරවර | සභාපති, හංවැල්ල නගරය ග්‍රාම සංවර්ධන සමිතිය, හංවැල්ල. | 368,370.85 |
| 08 | නැණසල ආවරණ තාප්පය තීන්ත ආලේප කර අළුත්වැඩියා කිරිම. | සභා අරමුදල් | සෘජු ශ්‍රමික | 119,533.16 |
| 09 | කහටපිටිය ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරිම. | පළාත් සංවර්ධන ප්‍රදාන ( විශේෂ) | සභාපති, කැළණි නදී වැඩිහිටි සංවිධානය, කහටපිටිය. | 228,704.52 |
| 10 | සීතාවක ප්‍රාදේශීය සභාව මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන සාහිත්‍ය තරගාවලිය සහ සාහිත්‍ය උත්සවය සඳහා . | සභා අරමුදල් | සරජ, සංවර්ධන නිලධාරි, ආර්.පී.එන්.පී. ජිනදාස මයා | 530,000.00 |

**<u>05 – (05) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

සීතාවක ප්‍රාදේශීය සභාවේ දැනට පවතින ගලි බවුසර රථය ඉතා අබලන් තත්වයේ පවතින බැවින් දේශිය ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබා ගෙන නව ගලි බවුසර් රථයක් මිලදී ගත යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>05 – (06) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

සීතාවක ප්‍රාදේශීය සභාවේ 06 වන මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් පුළුල් කරන ලද සභා ශාලාවේ ශබ්ද විකාශන පද්ධතිය නවීකරණය කිරීම වෙනුවෙන් රු. 3,143,301.90 ක මුදල කොළඹ 07, ලෝරිස් පෙදෙස, නො.17 හි ඩයිනමයික් ඒවී ටෙක්නොලජිස් පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>05 – (07) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) වන වගන්තියට අනුකූලව සීතාවක ප්‍රාදේශීය සභාවේ සභා කටයුතු පවත්වාගෙන යාම පිළිබඳව උපදෙස් ලබා ගැනීම සඳහා පක්ෂ නායකයින්ගෙන් සමන්විත කාරක සභාවක් පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>05 – (08) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 461 දරණ පාදුක්ක ග්‍රාම නිලධාරී වසමේ ඩයිමන් බේකරිය අසලින් ආරම්භ වී වෙල අයින දිගේ ජයන්ති මාවතෙන් අවසන් වන මාර්ගය "ඩී.ඩී. කරුණාරත්න මාවත" ලෙස නම් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>05 – (09) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නන්ද කුමාරසිංහ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

අංක 435 කහටපිටිය ග්‍රාම සේවක වසමේ පිහිටි වර්ෂයක් හැර වර්ෂයක් සීතාවක ප්‍රාදේශීය සභාවට ආදායම් ලබා දෙන ''අකරවිට කපුගොඩ තොටුපල" බල ප්‍රදේශයේ ජනතාවට කපුගොඩට එගොඩ වීම සඳහා මහඟු සේවාවක් ඉටු කරන ස්ථානයක් වේ.

දැනට මෙම ස්ථානය ජනතාවට එගොඩ මෙගොඩ වීමට නොහැකි ලෙස අනාරක්ෂිත ස්ථානයක් බවට පත්ව ඇති බැවින් මේ සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සංවර්ධනය කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>05 – (10) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

කොස්ගම කොට්ඨාසයේ ඉහළ කොස්ගම උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හා හිගුරල කොට්ඨාසයේ අලුත් අම්බලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මායිම වන හීන් ඇල්ල ඇල ඉතා කුඩා වැස්සකදී පවා පිටාර ගැලීම හේතුවෙන් දොළ ඉහළ ග්‍රාමයේ නිවාස 25 කට ආසන්න ප්‍රමාණයක් යට වීමේ ගැටළුවකට මුහුණ පා ඇත. මේ හේතුවෙන් ඇල ආසන්නයේ දිවෙන ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය කැඩී අබලන් තත්වයට පත්ව ඇති අතර

මාර්ගයේ ආරම්භයේ සහ මධ්‍යයේ ඇති පාලම් දෙක කැඩී යාමේ තර්ජනයකට ලක් වී ඇත. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා කෘෂි කර්ම දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇල මාර්ගයේ ජල බැස්ම නිවැරදි කර මාර්ගය ආරක්ෂාව සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන මාර්ගය සංවර්ධනය කිරිමටත් කටයුතු කොට ජනතාව පත්ව ඇති පීඩාව නැති කිරිමට කටයුතු කළ යුතු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>05 – (11) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

2018 පැවති පළාත් පාලන මැතිවරණය නව ක්‍රමයකින් කොට්ඨාස මට්ටමින් පැවැත්වීම හේතුවෙන් විශාල ගැටළු සහගත තත්වයක් නිර්මාණය වී ඇත. විශේෂයෙන් සභික ධූර වැඩි වීම ජනතාවගේ මුදල් සභාව මගින් දීමනා ගෙවීම වැනි වියදම් දැරීමට සිදුවී ඇත.

ජනතාවගෙන් ප්‍රතික්ෂේපිත වූවන්ද සභාව නියෝජනය සඳහා පැමිණීමේ ඉඩකඩක් මේ මගින් සැදී ඇත. තවද ප්‍රාදේශීය නායකයෙකුට සුදුසු නොවන පුද්ගලයන්ද සභාවේ නියෝජනය සඳහා පත්වීමේ ඉඩකඩ සැදී ඇත. මෙම කාරණා හේතුවෙන් නව මැතිවරණ ක්‍රමය සංශෝධනය කර සභික ධූර ප්‍රමාණය අඩු කර සභාවේ මුදල් එලදායී සේවාවන් සඳහා යෙදවීමට හැකි මැතිවරණ ක්‍රමයක් සැකසිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

06.කාරක සභා වාර්තා .

06 – (01 ) 2018.05.21 නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්විමේ වාර්තාව.

06 – (02 ) 2018.05.22 කාර්මික සේවා කාරක සභා රැස්වීමේ වාර්තාව.

06 – (03 ) 2018.05.25 පරිසර හා පහසුකම් කාරක සභා රැස්වීමේ වාර්තාව.

06 - (04) 2018.05.28 මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීමේ වාර්තාව.

0) - 065 (2018.05.11 ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

0) - 066 (2018.05.28 ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ.

07 – (01) 2018 මාර්තු මාසය ලැබීම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය.

07 – (02) 2018 අප්‍රේල් මාසය ලැබීම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය.

08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික ප්‍රකාශ.